තුනුක්කායි ප්‍රාදේශිය සභාව

මුලතිව් දිස්ත්‍රික්කය.

---

1. මූල්‍ය ප්‍රකාශ

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 ජුනි 25 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 04 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 07 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව තුනුක්කායි ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට තුනුක්කායි ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්විම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වු ගිණුම්කරණ අඩුපාඩු ආදායම් සහ වගකීම් යටතේ විග්‍රහ කොට පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | 1 | 405,900 | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | - | - | 1 | 36,000 |
| වර්ගීකරණ දෝෂ | 1 | 80,000 | - | - | - | - |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා රු.3,075,993 ක් වටිනා ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.601 ක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,801,289 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

අයවැය ලේඛණය නිසි පරිදි පිළියෙල කර නොතිබුණු අතර එබැවින් අයවැයගත සහ තථ්‍ය ආදායම සහ අයවැයගත සහ තථ්‍ය වියදම අතර පිළිවෙලින් රු.1,704,630 ක් සහ රු.459,458 ක් වූ විචලනයන් විගණනයේදි නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් සහ බදු | 05 | - | - |
| බදු කුලී | 3,667 | 4,009 | 135 |
| බලපත්‍ර ගාස්තු | 724 | 142 | - |
| වෙනත් ආදායම් | 6,965 | 5,506 | - |

2.3.2 ආදායම් අයකර ගැනීම

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා හිඟ බදු කුලී රු.116,500 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රදේශයේ ත්‍රිරෝද රථ හිමිකරුවන් 41 දෙනෙකුගෙන් අයවිය යුතු රු.17,400 ක් වූ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

2.3.3 උසාවි දඩ

(අ) සමාලෝචිත වර්ෂය සඳහා විවිධ ආඥා පණත් යටතේ උසාවි වලින් අයවිය යුතු උසාවි දඩ අයකරගෙන නොතිබුණි.

(ආ) 2011 වර්ෂය සඳහා වූ උසාවි දඩ රු.4,025,650 ලැබිය යුතු ආදායම් ලෙස දක්වා තිබුණ ද එම දඩ මෙම වාර්තාවේ දිනය දක්වා අයකර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

-----------------------------

2.4.1 තොග ශේෂය

---------------

තොග අයිතම් 12 ක ශේෂයන් භෞතික ශේෂයන් මත නොව පොත් ශේෂයන් මත දක්වා තිබුණි.

2.4.2 අත්තිකාරම්

-------------

(අ) සමාලෝචිත වර්ෂය තුල සභාවේ ලේකම්වරයා විසින් ලබාගෙන තිබූ රු.132,292 ක් වූ අත්තිකාරම් මෙම වාර්තාවේ දින තෙක් නිරවුල් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අත්තිකාරම් ලබා ගත් කාර්යය නිමවූ විගසම අත්තිකාරම් නිරවුල් කළ යුතුය. කෙසේ වුවද නිලධාරියෙකුට දෙන ලද රු.70,000 ක් වූ අත්තිකාරමෙන් රු.41,674 ක් එම නිලධාරියා විසින් නිරවුල් නොකොට සැලකිය යුතු කාලයක් රඳවාගෙන තිබුණි.

2.4.3 කාර්යමණ්ඩල ණය

------------------------

වර්ෂ 04 ක පෙර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 76,870 ක් වූ කාර්ය මණ්ඩල ණය ඔහුගේ පාරිතෝෂික ගෙවීම් වලින් අඩුකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.5 අනුකූල නොවීම්

-------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| ------------------------------ | | -------------------- |

(අ) ප්‍රාදේශීය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති - 1989

| | | | |
|---|---|---|---|
| (i) | II පරිච්ඡේදයේ 5 වගන්තිය | - | මුදල් සහ ගබඩා ආදිය පිළිබඳව කටයුතු කරනු ලබන නිලධාරින්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි. |
| (ii) | II පරිච්ඡේදයේ 14 වගන්තිය | - | වියදම් සඳහා අතිරේක අරමුදල් ලබා ගැනීම සඳහා නියමිත කාලයේදි යෝජනාවක් සම්මත කර ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | III පරිච්ඡේදයේ 29 වගන්තිය | - | මුළු මුදල් එකතු කිරිම් දිනපතා බැංකු ගතකර නොතිබුණි. |
| (iv) | III පරිච්ඡේදයේ 59, 60 වගන්ති | - | වෙළඳ බදු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (v) | III පරිච්ඡේදයේ 65 වගන්තිය | - | ආදායම් ලිපිකරු විසින් වෙළඳ බදු පැහැරහරින්නන් පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (vi) | III පරිච්ඡේදයේ 66 වගන්තිය | - | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව රු.5,010,631 ක්වූ හිඟ මුදල් අයකර ගැනිමට ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |
| (vii) | IV පරිච්ඡේදයේ 97 වගන්තිය | - | ගෙවිම් වවුචර් වල සඳහන් වැඩසටහන් සහ අරමුණු වලට අදාල සංකේත අංක අයවැය ලේඛණයට අනුව නොවිය. |

(ආ) මුදල් රෙගුලාසි 571 - වර්ෂ 2 කට වැඩි රු.161,500 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සභාව විසින් එකතු කළ රු.270,329 ක්වූ එකතු කළ අගය මත බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 වගන්තියේ 19 ඇමුණුම - රු.246,902 ක්වූ වාහන අළුත්වැඩියා සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

2.6.1 වැඩ ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදයන්

----------------------------------------

වටිනාකම රු.198,655 ක් වූ බහාලුම් ගොඩනැගිල්ලක් ඉදිකිරිම සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) ඇස්තමේන්තු, මිළ කැඳවීම් සහ වැඩ නිම කිරිමේ වාර්තා නොමැතිව වටිනාකම රු.422,892 ක් වූ වාහන අළුත්වැඩියාවන් සභාව විසින් සිදුකර තිබූ බැවින් වාහන අළුත්වැඩියාව සම්බන්ධයෙන් සභාව නිසි පරිපාටියක් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) බහාළුම් ගොඩනැගිල්ලක් ඉදිකිරිමට අදාල රු.198,655 ක්වූ විවිධ ණයගැතියෝ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ආදායම් එකතු කිරීම
(ආ) අත්තිකාරම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) අයවැය ලේඛනය
(ඉ) සමීක්ෂණ මණ්ඩල වාර්තා
(ඊ) විවිධ ණයගැතියෝ
(උ) වාහන උපයෝජනය
(ඌ) ටෙන්ඩර් මණ්ඩල තීරණ